18 වන පිටෙන්

එවැනිම නිර්දේශයක් කළේය.

මෙවර හයිබ්‍රිඩ් අධිකරණ නිර්දේශය ඉදිරිපත් කළේ මානව හිමිකම් බරපතළ ලෙසින් උල්ලංඝනය වූ චිලී රාජ්‍යයේනි. චිලී හමුදා නායක පිනෝචේ ඇමෙරිකානු සී. අයි. ඒ. සංවිධානයේ සහාය මත සැල්වදෝර් අයන්ඩේ රජය පෙරළා දමා වෘත්තීය සමිති නායකයන් සහ විද්වතුන් ඇතුළු දස දහස් ගණන් ඝාතනය කළ අවස්ථාවේ හයිබ්‍රිඩ් අධිකරණයක් ස්ථාපිත වූයේද?

ශ්‍රී ලංකාවට යුද අපරාධ චෝදනා කරන මිචෙලි බැචලට් පවා හමුදා අත්අඩංගුවේ පසුවිය.

චිලී රාජ්‍යේ ප්‍රකට නායකයකු වූ වික්ටර් හාරා පවා ඝාතනය විය. පිනෝචේ ඝාතනය කළේ තම රටේ සිවිල් වැසියන් ය. එහෙත් මෙරට හමුදාව සටන් කළේ බිහිසුණු කොටි ත්‍රස්තවාදීන්ට එරෙහිවය.

මෙවැනි විටෙක කොටි සිදුකළ යුද අපරාධ ගැන විමර්ශනය කිරීමට හයිබ්‍රිඩ් අධිකරණයක් පිහිටුවිය යුතු බව බැචලට් ප්‍රකාශ කර නැත.

මිචෙලි බැචලට් මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කළ විමර්ශන වාර්තාවෙන් ශ්‍රී ලංකාව බරපතළ තත්ත්වයකට පත්ව ඇත. ඇය ශ්‍රී ලංකාවේ එන්. ජී. ඕ. සංවිධාන මෙන්ම ද්‍රවිඩ සංවිධාන පමණක් නොව උතුරු පළාත් සභාවේ හිටපු මහ ඇමැති විග්නේෂ්වරන් විසින් ඇය වෙත ඉදිරිපත් කළ වාර්තාව ද පිළිගෙන තිබේ.

එසේම ඇගේ වාර්තාවට අමුද්‍රව්‍ය සපයා ඇත්තේ මෙරට රාජ්‍යනොවන සංවිධානයක් බව වාර්තා වේ. අඩංගු මූලාශ්‍ර වලින් තහවුරු ය.ඇය සිය වාර්තාවෙන් ශ්‍රී ලංකාව ඉටු කළ යුතු නිර්දේශ 18 ක් දක්වා තිබේ.එම නිර්දේශ මෙසේය,

1. සංහිඳියාව පිළිබඳ කාර්ය සාධන බළකායේ නිර්දේශ ඉටු කරනු.
2. පිහිටුවා යෝජනාව ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව සකස් කරනු.
3. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් විමර්ශනයට පිහිටුවා මානව හිමිකම් කාර්යාලයක් ස්ථාපිත කරනු.
4. වධ හිංසා පිළිබඳ සොයා බැලීමට එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයකුට ඇරයුම් කරනු.
5. රෝම සම්මුතියට අදාළ ජාත්‍යන්තර අධිකරණයට අත්සන් කරනු.
6. යුද අපරාධවලට අදාළ නීතිරීති සම්මත කරනු.
7. ජාත්‍යන්තර විනිසුරුවන් සහිත හයිබ්‍රිඩ් අධිකරණයක් ආරම්භ කරනු.
8. මානව හිමිකම් කවුන්සිලයේ උපදෙස් මත ත්‍රස්ත මර්දන පනත වෙනුවට වෙනත් පනතක් ගෙන වීමේ නීතිරීති කෙටුම්පත් කරනු.
9. රැඳවුම් භාරයේ සිටින අයගේ (හිටපු කොටින්ගේ) නඩු නිරීක්ෂණයට ලක් කරනු.

මෙයට අමතරව එක්සත් ජාතීන්ගේ සාම සාධක බළකාය සහ හමුදා පුහුණු වැඩසටහන් සඳහා තෝරා ගැනීමේදී නිෂ්කාශන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ලෙස ඇය එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ඉල්ලා සිටියි.

මේ හැර මානව හිමිකම් කවුන්සිලයට අයත් සාමාජිකයන් 47 කගෙන් ද මානව හිමිකම් කොමසාරිස්වරිය ඉල්ලා ඇත්තේ කුමන පසුබිමක් යටතේ හෝ යුද අපරාධ චෝදනා එල්ල වී අයහට එරෙහිව චෝදනා ගොනුකර විගස එරට අධිකරණ පද්ධතිය මත කටයුතු කරන ලෙසයි.

මානව හිමිකම් කොමසාරිස් ලෙස කටයුතු කළ සෙයිද් රාද් හුසේන්ගෙන් පසු ශ්‍රී ලංකාවට එරෙහිව බරපතලම ඒකපාක්ෂික වාර්තාව පසුගිය බදාදා ප්‍රකාශයට පත් වූ වාර්තාවයි.

මේ වාර්තාවේ අඩංගු කරුණුවලින් කිසිදු විමර්ශනයකින් තොරව ශ්‍රී ලංකාවේ හමුදාව යුද අපරාධ සිදුකළ බවට සනාථ කර ඒ අනුව ගත යුතු පියවර ගැන නිර්දේශ කර තිබේ.

එසේ මානව හිමිකම් කවුන්සිලය තුළ පැවති එක්සත් ජාතීන්ගේ වධහිංසාවලට සම්බන්ධ අනුකමිටුව පැවැත් වූ සාකච්ඡා වලදී ශ්‍රී ලංකාවේ වධහිංසා සිදුවන බවට තීන්දු වී ඇත. ඒ අනුව ලබන අප්‍රේල් මස විමර්ශන කණ්ඩායමක් මෙරටට පැමිණ ඒ පිළිබඳව විමර්ශනය කෙරේ.

මෙම විමර්ශන කණ්ඩායම පමණක් නොව මානව හිමිකම් කොමසාරිස්වරියගේ වාර්තාව කෙටුම්පත් කිරීමට මුල් වී ඇත්තේ ද යස්මින් සූකා බව පිහිටුවා ආරංචි මාර්ග හෙළි කළේය.

මේ අතර කොටි ඩයස්පෝරාව සහ යස්මින් සූකා එක්ව මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වාට එරෙහිව මානව හිමිකම් කවුන්සිලයට සාවද්‍ය වාර්තා යොමු කර ඇතැයි මෙයට පෙර ආරක්ෂක විශේෂඥයෙන් විශේෂයෙන් හෙළි කළෙමු.

අප කළ අනාවරණය සනාථ කරමින් මානව හිමිකම් කොමසාරිස් මිචෙලි වෙරෝනිකා බැචලට් පිටු 15 කින් යුත් වාර්තාවේ මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ගැන ද සඳහන් කර තිබේ.

ඇය සිය වාර්තාවේ දක්වා ඇත්තේ මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ජනවාරි 9 දා හමුදාවේ මාණ්ඩලික ප්‍රධානියා ලෙස පත් කිරීම ගැන කනගාටුවන බවයි.
58 වැනි සේනාංකය මෙහෙය වූ මේජර් ජෙනරාල්වරයාට එරෙහිව යුද අපරාධ චෝදනා එල්ල වී ඇති බව ද ඇය සිය වාර්තාවේ දක්වා ඇත.

මෙම වාර්තාවෙන් මානව හිමිකම් කොමසාරිස්වරිය ශ්‍රී ලංකාවේ රජයට නිර්දේශ කර ඇත්තේ රෝම සම්මුතිය හෙවත් අන්තර්ජාතික අධිකරණය පිළිගන්නා ලෙසයි.

මේ අතර පිහිටුවා මානව හිමිකම් කවුන්සිලයේ ඒකපාක්ෂිකභාවය ගැන දැඩි කෝපයට පත් පිහිටුවාහි ශ්‍රී ලාංකිකයෙක් පැවසුවේ මේ අභූත චෝදනා එල්ල වූයේ ප්‍රභාකරන් පරාජය කිරීම නිසා බවයි.

යම් ලෙසකින් ශ්‍රී ලංකා හමුදාව පරාජය වූවා නම් එකම යුද අපරාධ චෝදනාවක්වත් එල්ල නොවන බව ඔහු කියා සිටියේය.
මේ තත්ත්වය මත 40 වැනි පිහිටුවා මානව හිමිකම් සමුළුව මාර්තු 22 දා අවසන් වූයේ ශ්‍රී ලංකාවට එරෙහිව කොටි ඩයස්පෝරාවේ සහ එන්. ජී. ඕ. සංවිධානවල වාර්තා සහ ඉල්ලීම්වලට එකඟ වෙමිනි.

මේ සමුළුව හමුවේ ශ්‍රී ලංකාව සත්‍ය තත්ත්වය පෙන්නුම් කළත් ඒ කිසිදු වාර්තාවක් පිළිගැනීමට මානව හිමිකම් කොමසාරිස් වරිය ක්‍රියාකර නැත. මේ බව ඇගේ වාර්තාව සාක්ෂි දරයි.

24 වන පිටෙන්

ඇගේ සැමියාත් කැඳවා ගෙන ගියේය. මේ පිරිස දැක කමල්ගේ මව තිගැස්සී මොහොතක් බලා සිටියාය. සීතා' නැන්දේ කියා ඈ බදාගෙන හඬා වැලපෙන්නට වූවාය. 'අම්මේ මේ රාමන්ගේ දූ සීතා' 'මොනවා මට නම් ඔයා හඳුනාගන්නත් බෑ. යමු යමු ගෙට' කියා අම්මා ඔවුන් ගේ තුළට කැඳවා ගෙන ගියාය. ඉනික්බිති වහා තේ පිළියෙල කර සිගිත්තාට බිස්කට් දුන්නාය. මහ කතරකදී දිය පිපා සෙන් පෙලුන තැනැත්තෙකුට සිහිල් දිය දහරාවක් හමුවුවා සේ සීතාට දැනින. ගතවූ කාල පරාසය තුලදී ඔවුන් මුහුණ දුන් කටුක අත්දැකීම් සියල්ල හෙළි කලේ රෑරා ඇද හැලෙන කඳුලු මැද්දේය.

සිය මවත් කමලුත් මේ තිදෙනාට උදව් කළ යුතු බව තීරණය කළෝය. කුලියට ගත් කුඩා නිවසේ ඉඩ කඩ සීමිතය. නමුත් මේ අසරණ අනාථයන්ට කොහි කියා යන්නද? පෙරුමාල්ට රැකියාවක් සොයා දෙන ලෙස ඔහු කමල්ගෙ න් බැගෑපත්ව ඉල්ලා සිටියේය. හැදුනුම්පතක් ඔහුට නොතිබුන නිසා එය රැකියාවක් ලබා ගැනීමට බාධාවක් විය. කමල් තම හිත වතෙකු ගෙයක් ඉදිකරන තැනක කුලී වැඩක් ලබාදුන්නේය. සීතාත් ඇගේ දරුවාත් කමල්ගේ මව ලඟ රැදී සිටියෝය. නමුත් ඔවුන්ට කුඩා ගෙදර සිටිය නොහැකි බවත් නගරයේ ජීවත්වීම ඉතා බැරෑරුම් ප්‍රශ්නයක් බවත් කමල්ට මෙන්ම ඔහුගේ මවටද වැටහින. සතියක් පමණ ගතවූ පසු සීතාගේ දරුවාත් සැමියාත් කැඳවා ගෙන ජනපදයට ගියේය.

නිමල්ට ගුරු වෘත්තියත් ගොවිතැන් කටයුතුත් කිරීම අසීරු විය. ඒ නිසා ඔවුන් ජනපදයේ පදිංචි කරවා ගත්තේ රාමන් ගිය පසු කඩය කීප දෙනෙක්ම කුලියට ගෙන වෙළදාම් කළත් සරු ආදායමක් නොලැබීම නිසා එය වසා දමන්නට සිදුවිය. පාලුවට ගිය කඩය නැවත පිළිසකර කර පෙරුමාල්ගේ පවුලට පදිංචි වීමට සැලැස්සුවේය. සීතා තම අතීත සිදුවීම් එකිනෙක සිතට ගලා එන්නට විය. ඈ පෙරුමාල්ගේ බිරිඳ වූයේ ගත යුතු වෙනත් විකල්පයක් නැති නිසාය. ඈට පෙරුමාල් හොඳ ස්වාමිපුරුෂයෙක් විය. ලොව සෑම දෙයක්ම නිත්‍ය නොවන බවත් ආශා පොදි බැඳ සිටියත් අවසානයේ දුක හිමිවෙන බව කමල්ට වැටහින. ජීවිතාන්තය දක්වාම තනිකඩ ජීවිතයක් ගෙවීමට ඔහු සිතුවේය. සීතා නිතරම කමල්ට පෙළුවහක් කර ගැනීමට කන්නලව් කලාය. එහෙත් ඔහුට ඒ ගැන සිතන්න බැරි ලෙසට සිත දරදඬුවී ගොස්ය. ඔහු සිය මවත් රැකබලා ගෙන සීතාගේ කැදැල්ලට උදව් කරමින් ජීවිතය ගෙවීමට සිතුවේය.

රාවන්ගේ පවුලේ සැම ගමෙන් පිටවී ගිය පසු කමල්ට නිතරම සීතා මතක් විය.

ඈ හා ගෙවූ සොඳුරු කාලය ඔහුගේ දිවිමගේ වසන්ත කාලය විය. ඇගෙන් තොර ලොවක් නැතුවා සේ දැනින. රඝුද ඔහුට කල්‍යාණ මිත්‍රයෙකුට වඩා සහෝදර ප්‍රේමය ක් දැක්වූ බව සිතුවේය. ඔවුන්ගේ වෙන්ව යාම කමල්ට ඉවසා දරාගත නොහැකි විය. ඔහු ඒ නිසා ගමෙන් කොළඹට ගියේය. ඉන් පසු ඔහු ගමට ආවේ කලාතුරකින්ය. එහෙත් සීතා ගමට යළි ආපසු කමල් සෑම සති අන්තයේම ගමට එන්නට පුරුදු වී දවස් දෙකේ වැඩිපුරම කාලය ගෙවීවේ සීතාගේ නිවසේය. සීතා අන් පුරුෂයකුගේ බිරිඳ බව දැන දැනත් ඈ හා පෙරමෙන් විහිලුවෙන් සතුටින් කථා බහ කරමින්ද ඔවුන්ගේ දරුවා සුරතල් කරමින්ද තෑගි බෝග බඩු දෙමින්ද කාලය ගෙවීමට පුරුදු වූවේය. පෙරුමාල්ට තම බිරිඳ කමල් හා සතුටු සාමීචියේ යෙදී සිටීම තම හදේ විෂ කටුවකින් ඇනෙන්නා සේ දැනින.

සියුම් වේදනාවක්ද තරහක්ද ඊර්ෂියාවක්ද ඇතිවිය. එහෙත් තම පවුල වැටුන වලෙන් ගොඩ ගත්තේ කමල් නොවේද?

ඔහුට ද්‍රෝහිව යුධ ප්‍රකාශ කළ නොහැකි බව සිතමින් ඔහු ප්‍රශ්න අතර ගැටෙමින් සිටියේය. සීතාත් කමලුත් පෙම්වතුන් වී සිටි බව පෙරුමාල්ට වටින් ගොඩින් දැන ගන්නට ලැබුණේය. මේ නිසා ඔහු කමල් ගැන නිතරම සැකයෙන් බැලුවේය. සීතාද දැන් පෙරට වඩා ප්‍රීතියෙන් සතුටින් නිතර ප්‍රබෝධමත්ව කාලය ගෙවන බවත් ඈ තමාට වඩා දයාබර ලෙස කමල් දෙස බලන බවත් සිතුණි. පෙරුමාල්ගේ සිත සැකය නමැති සතුරා වෙලාගෙන තිබින. ඔහුගේ සිතට මෙය වදයක් මෙන් දැනින. කුඹුරට ගිය පෙරුමාල් නැවත හදිසි යේම තම ගෙදරට ආවේ ගැලවී ගිය උදලු මිට සවි කරගැනීමටය. ඔහු ගෙට එන විට සුළං පහරට ඉදිරිපස දොර වැසී තිබිණ. තම දරුවා එළිමහනේ තනියම් සෙල්ලම් කරමින් සිටියේය. ඔහු හෙමින් සීරුවේ දොර ඇර බලන විට කමල් හා සීතා සිනාසෙමින් මොනවාදෝ කියවමින්ය. පෙරුමාල් ආ වග සීතා නොදැනින. පෙරුමාල්ගේ සිත කෝපයෙන් ගිනි ගෙන ඇවිලී ගියේය. බුර බුරා නගින ගින්නක් මෙන් සැකයේ උච්චතම අවස්ථාව නැගී ආ පෙරුමාල් තම අත තිබූ උදලු තලයෙන් සීතාගේ හිස් මුදුනට පහරවල් කීපයක් දී මාරාවේශයෙ න් පැන දිව්වේය. කමල් වහා ලේ මැදින් සීතා රෝහල් ගත කලත් අවසන් වරට කමල්ගේ මුහුණ බලා ඈ අවසන් ගමන නිහඬව ගියාය.